# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
**Ministry of Women, Child Affairs and Social Security – Social Security Division**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No  DSD/HO/DG/චක්‍රලේඛ | ඔබේ අංකය<br>உமது இல<br>Your No  .............................................. | දිනය<br>திகதி<br>Date  2020.04.18 |

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය ලේකම්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය සමෘද්ධි මූලස්ථාන කළමනාකරු,

සමෘද්ධි බැංකු සමිති කළමනාකරු හා බැංකු කළමනාකරු,

සමෘද්ධි සංවර්ධන නිලධාරි,

සමෘද්ධි බැංකු සමිති හා බැංකු සභාපති.

**<u>උද්ගතවී ඇති ව්‍යවසනකාරී තත්වය නිසා සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යටතේ පොරොත්තු ලේඛනගත කර ඇති ප්‍රතිලාභීන් සඳහා රු. 5,000/- දීමනාවක් ගෙවීම.</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් සමාංක 2020.04.17 දින එවන ලද චක්‍රලේඛය හා බැදේ.

02. ඒ අනුව 2020.04.19 වන ඉරු දින මහජන බැංකු ශාඛා සියල්ල විවෘත කරන බවට තහවුරු කර ඇත. ලංකා බැංකු ශාඛා සියල්ල විවෘත කිරීමට ප්‍රායෝගික අපහසුතා පවතින බව අප වෙත දැනුම් දී ඇත. නමුත් සමෘද්ධි බැංකුව නමින් ජංගම ගිණුම් හිමි ලංකා බැංකු ශාඛා වලින් ලබා ගත යුතු මුදල් නිදහස් කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර ඇති බැවින් , පලාත්භාර සාමාන්‍යාධිකාරිවරුන් හා ප්‍රාදේශීය කළමණාකරුවන් සමඟ සාකච්ඡා කර පෙරවරු 8.00 සිට පස්වරු 2.00 දක්වා කාලය තුල දී , විවෘත කරනු ලබන සීමිත වූ ශාඛා වලින් මුදල් ලබා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන්න.

03. කුමන හෝ හේතුවක් මත ලංකා බැංකු ශාඛාවකින් අවශ්‍ය මුදල් ලබා ගැනීමට නොහැකි වුවහොත් , මහජන බැංකු ශාඛාවන්හි ජංගම ගිණුම් පවත්වා ගෙන යන ළඟම පිහිටි සමෘද්ධි බැංකුවෙන් ලිඛිත ඉල්ලීමක් මත මුදල් හුවමාරු කර ගැනීමට මින් බලය පවරමි. එසේ ලබා ගන්නා මුදල් 2020.04.20 වන දින හෝ 21 වන දින චෙක්පතකින් අදාල සමෘද්ධි බැංකුවට පියවිය යුතු වේ. මේ සඳහා "මුදල් හර / මුදල් බැර " හා “පැවරුම් හර / පැවරුම් බැර” වවුචර් මගින් පොදු ලෙජරයේ "අවිනිශ්චිත ණයගැති ගිණුම" හා "අවිනිශ්චිත ණයහිමි ගිණුම” ට සටහන් තැබීමට කටයුතු කරන්න.

04. 2020.04.20 වන දින පෙරවරු 6.00 ට රාජකාරි සඳහා සමෘද්ධි බැංකු විවෘත කර, අදාල නිලධාරීන් සේවයට වාර්තා කල යුතු අතර, එදින උදැසන සිට ම අනුමත ප්‍රතිලාභීන් වෙත සමාජ ප්‍රතිලාභ දීමනා ගෙවීමට කටයුතු කලයුතු බැවින් 2020.04.19 දින රුපියල් 5,000,000/-( මිලියන පහ) නොවැඩි මුදලක් සූදානම් කරතබා ගත යුතු බව අනිවාර්යය කාර්යයකි. ඉදිරි දිනවලදී ද අවශ්‍ය මුදල් ප්‍රමාණය ලබා ගැනීම සඳහා ලංකා බැංකු හා මහජන බැංකු කලමණාකාරුවන් සමඟ සාකච්ඡා කර සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ගතයුතු ය.


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |
| | | **Hot Line :0112-889007** | | | |

05. මෙම සමාජ ප්‍රතිලාභ දීමනා සඳහා  මුදල් ලැබීමේදී හා  වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත මුදල් භාරදීමේ දී සමාංක 2020.04.06 දින නිකුත් කරන ලද චක්‍රලේඛය අනුව කටයුතු කල යුතු  ය. මෙම මුදල් රජයේ මුදල් වන බැවින් අනුමත ප්‍රතිලාභීන් සඳහා මුදල් ගෙවීමේ දී වසම් මට්ටමින්  “පොදු 36 අ”  ආකෘති පත්‍රය භාවිතා කර එහි එකතුව සඳහා “පොදු 35  වවුචරය”  සකස් කර සමෘද්ධි බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු ය. මෙම මුදල් ගෙවීමේ කාර්යය සඳහා ග්‍රාමීය කමිටුවේ අනෙකුත් සාමාජිකයින්ගේ සහය ලබා ගැනීමට කටයුතු කළ යුතු ය.

06. මුදල් රැගෙන ඒමේ දී සහ සමෘද්ධි බැංකුව තුල රඳවා ගැනීමේ දී , ප්‍රදේශය භාර පොලිස් ස්ථානාධිපතිවරුන් සමඟ සාකච්ඡා කර සුදුසු ආරක්ෂක වැඩපිළිවෙලක් සකස් කර ගත යුතු බව වැඩිදුරටත් අවධාරනය කරමි.

06.මේ සම්බන්ධයෙන් ඔබ සැම දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

| | | |
|---|---|---|
| 1. | කාන්තා ළමා කටයුතු හා සමාජ ආරක්ෂණ අමාත්‍ය<br>ගරු පවිත්‍රා වන්නිආරච්චි මැතිණිය | - කා.දැ.ස. |
| 2. | ජනාධිපති ලේකම් ,ආචාර්ය පී.බී.ජයසුන්දර මහතා | - කා.දැ.ස. |
| 3. | අග්‍රාමාත්‍ය ලේකම්, ගාමිණී එස්. සෙනරත් මහතා | - කා.දැ.ස. |
| 4. | ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය | - කා.දැ.ස |
| 5. | රාජ්‍ය ලේකම් ,සමාජ ආරක්ෂණ අංශය | - කා.දැ.ස. |
| 6. | විගණකාධිපති ,විගණකාධිපති දෙපාර්තමේන්තුව | - කා.දැ.ස |
| 7. | අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව | - කා.දැ.ස. |
| 8. | සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව | - කා.දැ.ස. |
| 9. | ප්‍රධාන විධායක නිලධාරී , මහජන බැංකුව | - කා.දැ.ස. |
| 10. | ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| 11. | අධ්‍යක්ෂ, ක්ෂුද්‍ර මූල්‍ය, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |
| 12. | සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - අ.ක.ස. |